# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වෛද්‍ය නිලධාරී තනතුර (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම 3)**

**අ) යෝග්‍යතාවය**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් MBBS උපාධිය හෝ ඒ හා සමාන උපාධියක් සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍ය නිලධාරියෙකු ලෙස ලියාපදිංචි වී සිටීම

**සමග**

**පළපුරුද්ද**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාවේ රජයේ හෝ පෞද්ගලික රෝහලක වෛද්‍ය නිලධාරියෙකු ලෙස වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබිය යුතු වේ.

කාර්මික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවය කර ඇති වෛද්‍යවරුන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**ආ) වැටුප**

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 3 : 3 (SLM 3) |
| ආරම්භක වැටුප | : | රු. 61,500/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,555/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 111,700/- ක් පමණ වේ.

**සටහන I :**

තෝරාගනු ලබන අයදුම්කරුවන්හට අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන වාහනයක් සමග අනෙකුත් ප්‍රතිලාභද හිමි වේ.

**සටහන II :**

සේවා අවශ්‍යතාවය මත පිරිමි අපේක්ෂකයින් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**සැලකිය යුතුයි**

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීති රීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්ෂකයන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාසයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග **ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13** යන ලිපිනයට ලැබෙන සේ 2021.03.20 වන දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ විද්‍යුත් තැපැලෙන් (chrm@slpa.lk) එවිය යුතුයි. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු / සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති.**